# රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
# பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
# MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

| | | | |
|---|---|---|---|
| දුරකතනය<br>தொலைபேசி: **(94) 011- 2694560**<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல்: **(94) 011- 2692254**<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk**<br>E-mail | වෙබ් අඩවිය<br>இணைத்தளம்: **www.pubad.gov.lk**<br>Web Site |


---

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No } CS/DOS/24/01/01 | ඔබේ අංකය<br>உமது இல<br>Your No } | දිනය<br>திகதி:<br>Date } 2016.03.31 |

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්/**
**දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත**

**<u>සංවර්ධන නිලධාරී පත්වීම් ස්ථිර කිරීම</u>**

පරිවාස කාලයේ පසුවන සංවර්ධන නිලධාරීන් අතුරින් පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පහත සඳහන් **<u>ලේඛනවල සහතික කරන ලද පිටපත්</u> ඔබගේ නිර්දේශය සහිතව** කඩිනමින් මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි. **(ඉහත සඳහන් ලිපිලේඛන යොමුකිරීමේදී නිලධාරියාගේ/නිලධාරිනියගේ පත්වීම් ලිපි අංකය (CS/DOS/XXXXX) සඳහන් කිරීමට කාරුණික වන්න)**
තවද, මේ සම්බන්ධයෙන් අදාල කටයුතු සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු නම් කර ඔහුගේ/ඇයගේ රාජකාරි දුරකථන අංකය දන්වා එවන මෙන් වැඩිදුරටත් දැනුම් දෙමි.

- වැඩ භාර ගැනීමේ ලිපිය (3 සහ 4 පරිශිෂ්ඨ)
- E-hrm ආකෘතිය (මුල් පිටපත)
- පරිවාස කාලය තුළ ලබාගත් නිවාඩු සම්බන්ධ වාර්තාවක් (මුල් පිටපත)
- වෛද්‍ය පරීක්ෂණ වාර්තාව
- උපාධි සහතිකයේ විස්තරාත්මක ප්‍රතිඵල සටහන (Detail Certificate)
- උපාධිය විදේශ විශ්ව විද්‍යාලයක නම්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් බවට ලිපිය
- විශ්ව විද්‍යාල මගින් උපාධිය සනාථ කිරීමේ ලිපිය (මුල් පිටපත)
- දිවුරුම්/ප්‍රතිඥාව (පොදු 278)
- වත්කම් බැරකම් ප්‍රකාශය (පොදු 261)
- ගිවිස්නාව (පොදු 160)
- අවනතභාවය ප්‍රකාශ කිරීම (ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 157(අ) සහ 161(ඇ) (III) වන ව්‍යවස්ථාව)
- චර්යා සටහන (පොදු 53අ)
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති අනුව තුන් අවුරුදු සේවා වාර්තා (මුල් පිටපත)
- කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල සටහන (මේ දක්වා අප වෙත එවා නොමැති නම් පමණක්)

> **මෙය ඔබගේ පෞද්ගලික අධීක්ෂණය මත සිදුවිය යුතු බව අවධාරණය කරමි.**

**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**
**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්**